Page 11 June 2011.qxd 29/05/2011 18:39 Page 1



## පෙනීම නැතිවීම

**මා**නසික රෝගයකට ප්‍රතිකාර ගන්නට මානසික දොස්තර කෙනෙකු වෙත ගිය තැනැත් තෙකුගේ මානසික තත්වය පරීක්ෂාකිරීම සඳහා දොස්තර ප්‍රශ්න කීපයක් ඇසීය.

**දොස්තර** - මම ඔබේ වම් කන කැපුවොත් මොකක් වේවිද?

**රෝගියා** - මගේ කන ඇහෙන් නෙ නැතුව යාවි නේ

**දොස්තර** - එතකොට ඔබේ දකුණු කන කැපුවොත් ?

**රෝගියා** - අපෝ එතකොට මට පේන්නෙ නැතුව යාවි

**දොස්තර** - ඒ කොහොමද?

**රෝගියා** - ඇයි සර් කන් දෙක කැපුවම මං කොහොමෙයි කණ්ණාඩි දෙක දාන්නෙ?

## හරි ලස්සනයි

**සු**ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියෙකුගේ චිත්‍ර ප්‍රදර්ශණය නැරඹීමට පැමිණි එක් අමුත්තෙක් එක චිත්‍රයක් ළඟ නැවතී ඒ දෙස බොහෝ වේලාවක් බලා සිට මෙසේ කීවේ ය.

**අමුත්තා** - ෂාහ්! මේක නම් හරිම ලස්සනයි....හරිම ස්වාභාවිකයි .. චමත්කාර ජනකයි..... බලාගෙන ඉන්න කොට ඇත්තට කටට කෙළ උනනවා.......

**චිත්‍ර ශිල්පියා** - ඇයි කටට කෙළ උනන්නෙ....?මේකෙ තියෙන්නෙ ඉර බැහැගෙන යන දර්ශණයක් නේ...

**අමුත්තා** - හැබැට..... ? අනේ සොරි.... තරහවෙන්න එපා.... ඇත්තට මම හිතුවෙ ඒක බැදපු බිත්තරයක් කියලා....


ලිහිණියා LIHINIYA

ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල

වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලී සේවය

කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන

ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ

එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප පිට්ටු, රොටි කොත්තු, බුරියානි

උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.

Tel. 0208 450 9052

66 Cricklewood Broadway, London NW2 3EP



UK IMMIGRATION

Appeals, Asylum, Bail & Detention
Points Based System - Tiers 1,2,4&5
Human Rights & Leave to enter/remain
Divorce & Separation
Wills, Affidavits & Power of Attorney

*Call for consultation*

Colvin L. De Silva
Mobile 07956 502019




## ලෝකාන්තයට පනින්න ගිය විදුහල්පති

**ශ්‍රී** ලංකාවේ ඉතා පිටිසර පෙදෙසක කුඩා පාසැලක් තිබුණේය. මෙම පාසැලට අළුත් ගුරුවරියක් පත්වීම ලබා ආවා ය. ඇය අවිවාහක තරුණියකි. එම පාසැලේ ගුරුවරුන් සඳහා නේවාසිකාගාර පහසුකම් කිසිවක් තිබුණේ නැත. ගුරුවරිය පත්වීම ලබා පැමිණි දිනම තමාට නවාතැන් ගැන්මට සුදුසු තැනක් සොයා බැලුවා ය. ඇයට එදින පාසැල් සිසුවියකගේ නිවසේ තාවකාලික නැවතීමේ පහසුකම් ලැබුණි. පසු දින අළුත් ගුරුවරිය පාසැල් සිසුන්ගෙන් හා සිසුන්ගේ දෙමාපියන්ගෙන් තමාට නවාතැන් ගතහැකි තැනක් ගැන විමසා සිටිය ද කිසිම පලක් නොවී ය.

ඇය අවසානයේ විදුහල්පති හමුවී නවාතැන් පිළිබඳව විමසා බැලුවා ය. නමුත් ඔහු ද කියා සිටියේ තමා දන්නා අයුරින් ඒ ගමේ නවාතැන් දෙන කිසිම තැනක් නොමැති බව ය. විදුහල්පති ද ඒ ගමේ අයෙකු නොවී ය.

" සර් ගමේ කෙනෙක් නෙවෙයි නේ.... ඉතින් සර් කොහේද නැවතිලා ඉන්නෙ....? " තරුණ ගුරුවරිය විදුහල්පතිගෙන් ඇසුවා ය.


" මිස් වගේම මමත් මෙහේට ආපු දවසෙ ඉන්න තැනක් හොයාගන්න හුඟක් මහන්සි වුණා.... හම්බවුණේ නෑ.... බැරිම තැන මම ඉස්කෝලෙ මුල්ලෙ පාවිච්චි නොකර තිබුණු කාමරයක් ළමයින්ට කියලා සුද්ද කරවගෙන.... ඒකට ඇඳකුයි මේසෙකුයි දාගෙන... කාමරයක් හදා ගත්තා... මම එදා ඉඳන් අද වෙන කල් දැන් අවුරුදු දෙකක්ම ඒකෙ තමයි ඉන්නෙ...." විදුහල්පතිවරයා පිළිතුරු දුන්නේ ය.

" ආහ් සර් ඒවගේ පාවිච්චි නොකරන තව කාමර තියෙනවද මෙහේ....? එතකොට මටත් ඉස්කෝලෙම ඉන්න පුළුවන් නේ.....? " ගුරුවරිය ඇසුවා ය.

" නෑ මිස්.... තිබුණෙ එකම කාමරයයි... මිස් වැරදියට හිතන්න එපා මෙහෙම කිව්වට..... මම ඉන්න කාමරේ තියෙන්නෙ ලොකු ඇඳක් ...... මිස්ගෙ අකමැත්තක් නැත්නම් අපි ඇඳ දෙකට බෙදාගෙන ඉමු....." විදුහල්පති කීය.

විදුහල්පතිගේ යෝජනාව අසා ගුරුවරිය පුදුම වූවාය. අනික විදුහල්පති ද අවුරුදු 32 ක පමණ අයෙකි. මඳ වේලාවක් කල්පනා කළ ගුරුවරිය තමාට වෙන විකල්පයක් නැතිබව තේරුම්ගෙන විදුහල්පතිගේ එම යෝජනාවට එකඟ වූවා ය.

මේ ආකාරයෙන් අළුත් ගුරුවරිය හා විදුහල්පති ඇඳමැදට දිගට කොට්ට දෙකක් දමා, ඇඳ දෙකට වෙන්කර ගෙන එකම කාමරයක විසූහ. මෙසේ මාස හයක් පමණ ගතවිය.



ඒ කාලයේ පාසැලේ පළමුවන හා දෙවන ශ්‍රේණියේ ළමයි නුවර එළියේ ලෝකාන්තයට අධ්‍යාපන චාරිකාවක් ගියහ. අළුත් ගුරුවරිය දෙවන ශ්‍රේණියේ පන්තිය බාර ගුරුවරිය වූවා ය. අධ්‍යාපන චාරිකාවට විදුහල්පතිවරයා ද සහභාගි වූයේ ය.

ලෝකාන්තයේ සැඩ සුළඟට එක් ළමයෙකුගේ තොප්පිය ගැලවී ගොස් ලෝකාන්තයේ පල්ලමට වැටුණේය. තොප්පිය අහිමි වූ ළමයා අඬන්නට වීය. ඒ ළමයාගේ පන්තිය බාර ගුරුවරිය වූ අළුත් ගුරුවරිය ළමයා සනසන්නට කොතෙක් උත්සාහ කළ ද එය නොහැකි වීය.

මෙය දැක එතැනට පැමිණි විදුහල්පතිවරයා " ආහ් ඔය ළමයා අඬන්න එපා..... ඉන්න මම පැනලා තොප්පිය අරන් දෙන්නම්....." යයි කීවේ ය.

මෙය ඇසූ අළුත් ගුරුවරිය මෙසේ කීවා ය.

" කොට්ටෙන් මෙහා පැත්තට පනින්න බැරි මිනිහා කොහේද ලෝකාන්තයෙන් පනින්නෙ....? "


Community Legal Service

ANTONS
SOLICITORS

Community Legal Service
For Quality Services

We offer a comprehensive range of Legal Services.

| Conveyancing | Immigration |
|---|---|
| ♦ Sale & Purchase | ♦ Asylum cases |
| ♦ Right to buy (Council House) | ♦ Asylum Application |
| ♦ Re-Mortgage | ♦ Judicial Reviews |
| ♦ Assignment of Lease | ♦ Extensions of Visas |
| ♦ New Lease | ♦ Marriage Applications |
| ♦ Licensing Applications | ♦ Work Permits |
| ♦ Contractual Disputes | ♦ Business Visas |

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

*Contact -* Mrs Rani Bulathwela 0780 815 8360
Vajira – 0788 784 0227

ANTONS SOLICITORS
14 Wordsworth House, Wordsworth Parade
London N8 0SJ
Tel. 0208 888 6211 Fax 0208 888 1403



වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි

සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 /432236

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.

TRICO
Shipping & Forwarding Ltd

555 White Hart Lane
London N17 7RP
Telephone 0208 888 8787
Fax 0208 889 5445
E-Mail : trico@tricoshipping.com

නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය


## ඇමතීම

*බංගලාවේ ලොකු නෝනා නිවසේ වැඩකාරිය වන ඇසිලින්ගෙන් දිනක් මෙසේ ඇසුවාය.*

***ලොකුනෝනා*** - ඇසිලින්....මම මගේ මහත්තෙයට නම කියලා කතාකරනවා.... එහෙම නැත්නම් මගේ ඩාලිං කියලා කතාකරනවා... උඹට මොකද බැරි උඹේ මිනිහටත් එහෙම කතාකරන්න....? උඹ හැම තිස්සෙම කතාකරන්නෙ ළමයින්ගෙ තාත්ත කියලා නේ.... ඇයි ඒ ....?

***ඇසිලින්*** - මම එකත් එකටම දන්නව නෝනා ඒ මගේ ළමයින්ගෙ තාත්තා කියලා......

## පෙනීමේ වරද

**ඇ**ස් කණ්ණාඩි සාප්පුව වෙත පැමිණි කාන්තාව එතැන සේවය කරන තරුණියට මෙසේ කීවා ය.

" අපේ මහත්තෙය ගිය සුමානෙ මෙහෙන් කන්නාඩි කුට්ටම අරගත්ත නේ... ඒක මාරුකරගන්නයි ආවෙ...."

" ඇයි... මොකක්ද වැරැද්ද...? "

" මේක පාවිච්චිකරන්න හිටියට පස්සෙ එයාට මගේ වැරදිමයි පේන්නෙ......."

## තේරුම්ගැනීම

*මහාචාර්යවරයා එදින තම දේශනයේ දී සිසුන්ට මෙසේ කීවේ ය.*

***මහාචාර්ය*** - ගැහැණියක් තේරුම් ගන්න බැරි කාල පරිච්ජේද දෙකයි තියෙන්නෙ.

***ශිෂ්‍යයා*** - ඒ කොයි කාල පරිච්ජේද දෙක ද සර් ?

***මහාචාර්ය*** - බඳින්න ඉස්සෙල්ලයි.... බැන්දට පස්සෙයි....

***ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.***

***ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 12 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.***

Lanka Viththi
P. O. Box 64678,
London NW3 9LS


SHANTHI & CO ❋❋❋❋❋
Solicitors & Commissioners for Oaths

We are an established law firm in North London
Specialising in Immigration matters (Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)

♦ Residential / Commercial Conveyancing
♦ Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
♦ General Litigation (Sale of Goods, Services, Debts etc.)
♦ We offer comprehensive services on legal maters in Sri Lanka

*Contact*:- **Shanthi Senadheera** (*Solicitor*) **Padmini Senadheera** (*Solicitor*) **Dinu Senadheera** (*Solicitor*)

206 Seven Sisters Road, Finsbury Park, London N43NX
Tel. 020 7561 9494 Fax 020 7561 9495
Emergency: 07956 129 642 shanthi.co@btconnect.com